# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## නිල්වලා ගඟ හරහා ඇති ලවණ බාධකය
## நில்வளா கங்கையின் குறுக்கேயுள்ள உவர்நீர் தடுப்பு அணை
## SALINITY BARRIER ACROSS NILWALA RIVER

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකය නිරීක්ෂණය කරන්නට මමත්, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත්, සමගි ජන බලවේගයේ, සමගි ජන සන්ධානයේ මාතර දිස්ත්‍රික්කයේ සංවිධායකවරු සියලුදෙනාත් ගියා. මොකද, අද ඒ ලවණ බාධකය නිසා බරපතළ ඛේදවාචකයක් සිදු වෙලා තිබෙන නිසා.

මාතර නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකය නිසා ගංගා හරස්කඩ දැඩි ලෙස අවහිර වී ඇති බව වාර්තා වෙනවා. එම නිසා මෙතෙක් ආරක්ෂිතව පැවති කිරලකැලේ, කඩවැද්දුව, කද්දුව යන වාරිමාර්ග ව්‍යාපාර මෙන්ම මාතර නගරය ද අනාරක්ෂිත තත්ත්වයකට පත්ව තිබෙනවා. එපමණක් නොව, ගංගා ජලය නිසියාකාරව බැස නොයෑම නිසා ගොවිතැන් කරන ජනතාව ද දැඩි ලෙස පීඩාවට පත්ව සිටිනවා. අද වන විට කුඹුරු අක්කර 12,000ක් පමණ මේ නිසා විනාශ වෙලා තිබෙනවා. ඒ සමස්ත ගොවීන්ගේ ජීවිකාව සිදු කර ගත නොහැකි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ වැසි සහිත තත්ත්වය තුළ ඒ ප්‍රශ්නය උග්‍රතම තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා.

විශාල සංඛ්‍යාවකට බලපෑම් ඇති කරනු ලබන මෙම ගැටලුව ගැන විවිධ සාකච්ඡා ඔස්සේ එකඟතාවලට පැමිණි ඇතත්, අවසානයේදී එම එකඟතා අනුව බලධාරීන් ක්‍රියාත්මක නොවන බව පෙනී යනවා. ඇත්ත වශයෙන් වාරිමාර්ග අමාත්‍යාංශයත්, ජල සම්පාදන අමාත්‍යාංශයත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයත් මේ ප්‍රශ්නය නිසි ලෙස කළමනාකරණය කරලා විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. නමුත් එවන් තත්ත්වයක් තිබෙන බවක් මේ වන විට පෙනී යන්නේ නැහැ. ඇතැම් රාජ්‍ය ආයතන සිය අභිමතය පරිදිම කටයුතු කරගෙන යනවා. එබැවින් මේ සම්බන්ධයෙන් වග කිව යුතු අමාත්‍යාංශ විශේෂ අවධානය යොමු කර, පීඩාවට පත් වී සිටින අතිවිශාල සංඛ්‍යාවක් වූ ජනතාව මුහුණ පාන මෙම ගැටලුවට විසඳුම් ලබා දීමට කඩිනම් පියවර ගත යුතුව තිබෙනවා.

ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් හැටියට සලකා, එමෙන්ම මාතර දිස්ත්‍රික්කයේ දසදහස් ගණන් ජනතාවට අගතියක් කළ කාරණයක් හැටියට සලකා මා ඉදිරිපත් කරන පහත සඳහන් ප්‍රශ්නවලට රජයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

01. මාතර නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරුණේ කිනම් කාලයේදීද? එම ඉදිකිරීම් කටයුතු අවසන් කෙරුණේ කිනම් කාල වකවානුවේදීද? ඒ සඳහා අරමුදල් සැපයීම කෙරුණේ රාජ්‍ය භාණ්ඩාගාරය මඟින්ද? නැතහොත් වෙනත් ක්‍රමයක් ඔස්සේද? එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් සමාගම හැටියට කටයුතු කළේ කුමන සමාගමක්ද? ඒ සඳහා වැය කළ මුදල සම්පූර්ණ වශයෙන් කොපමණද? වැය කළ මුදල සම්පූර්ණයෙන් ගෙවා තිබේද?

02. එම ලවණ බාධකය ඉදිකිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලද්දේද? එසේ නම්, එම ශක්‍යතා අධ්‍යයන වාර්තාව සභාගත කිරීමට රජය කටයුතු කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද? ඒ හේතුවෙන් ගංගා හරස්කඩ දැඩි ලෙස අවහිර වී ඇති බව රජය පිළිගන්නේද? ඊට හේතුව වී ඇත්තේ ව්‍යාපෘතියේ සඳහන් පරිදි, as per the project design, අදාළ ඉදිකිරීම් නොකිරීමද? එසේ නම් ඊට වග කිව යුත්තේ කවුරුන්ද?

ඇත්ත වශයෙන්, project එකේ තිබෙනවා, collapsible gates දාන්න කියලා. අපට දැනගන්න තිබෙන ආකාරයට, project එක යන අතරතුරදී අමාත්‍යාංශ දෙකක ලේකම්වරු දෙදෙනෙක් එකට එක්කාසු වෙලා collapsible gates අවශ්‍ය නැහැ කියලා තීන්දුවකට ඇවිත් තිබෙනවා. කොහොමද ඒක සිදු වුණේ කියා දැනගන්න අපි කැමතියි.

03. එම ලවණ බාධකයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම් තක්සේරුවක් - Environmental Impact Assessment එකක් - සිදු කරන ලද්දේද? එසේනම් එම වාර්තාව සභාගත කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

04. ලවණ බාධකය හේතුවෙන් විපතට පත් වී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන කොපමණද? ඒ කවරේද? මෙම ලවණ බාධකය ඉදිකරනු ලබන කාලවකවානුවේදී ගොවීන්ට කොපමණ වගාකන්න සංඛ්‍යාවක් වගා කිරීමට නොහැකි වී තිබේද? ඉදිකිරීම් අවසන් වුවද, ගොවීන්ට නියමිත කන්නවලදී වගා කටයුතු කරගෙන යෑමට නොහැකි වී ඇති බව රජය දන්නේද? එසේනම් මේ නිසා දැඩි ලෙස අසරණ වී ඇති ගොවි ප්‍රජාව වෙනුවෙන් රජය ලබාදෙන සහනය කුමක්ද? මේ වන විට ඒ සඳහා ගෙන ඇති පියවර මොනවාද?

ඔබතුමන්ලාට මම කියන්න කැමැතියි, මේ ලවණ බාධක ව්‍යාපෘතියට පෙර කන්න 7කදී පිට පිටම වගා හානි සිදු වුණු බව. ඒ සඳහා කිසිම වන්දියක් ලබා දී නැහැ. ලවණ බාධකය ඉදිකළාට පස්සේ කන්න දෙකක් හානි වෙලා තිබෙනවා. මේ කන්නයේත් හානි වෙලා තිබෙනවා. එතකොට ඔක්කෝම ආසන්න වශයෙන් කන්න 10කදී පිට පිටම වගා හානි වෙලා තිබෙනවා. එතකොට මේ ලවණ බාධකයෙන් බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලැබිලා නැහැ. විශාල මුදලක් මේකට වැය කර තිබෙනවා.

05. ලවණ බාධකය හේතුවෙන් නිල්වලා ගඟේ ජල ධාරිතාව ඉහළ යෑමත් සමඟ අකුරැස්ස, අතුරලිය, මාලිම්බඩ, තිහගොඩ සහ මාතර ආවරණය වන පරිදි බැඳ ඇති වෙලි කැඩීයෑම නිසා ඉදිරියේදී සමස්ත මාතර නගරයම ජලයෙන් යටවීමේ අවදානමක් ඇති බව රජය පිළිගන්නේද? එසේ නම් ඒ සම්බන්ධයෙන් රජය ලබාදෙන කෙටිකාලීන හා දිගුකාලීන විසඳුම් කවරේද?

ඇත්ත වශයෙන්ම කියන්න කනගාටුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමගි ජන බලවේගය නියෝජනය කරන එක මන්ත්‍රීවරයායි, මාතර දිස්ත්‍රික්කයේ ඉන්නේ. මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන අනෙක් මන්ත්‍රීවරු සියලුදෙනාම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු -රාජ්‍ය පාර්ශ්වයේ- පාර්ශ්වයේ. රාජ්‍ය පාර්ශ්වයේ කිසිම මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා මේ කිසිම ප්‍රශ්නයක් පිළිබඳව හොයලා බලලා මේකට විධිමත් විසඳුමක් ලබා දෙන්නට මේ අවුරුදු ගණනාව පුරාවටම කටයුතු කරලා නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, රජය නියෝජනය කරන ඇමතිවරුනුත්, මන්ත්‍රීවරුනුත් ඒ ස්ථානයට ගිහිල්ලා, ස්ථාන පරීක්ෂාවක් කරලා, නිලධාරීන් ගෙන්වලා, මේ ජනතාවට ලබා දිය යුතු විසඳුම ලබා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දෙන්නට කටයුතු කරන්න කියලා. එතැනට ගිය එකම පිරිස මමයි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමායි, සමගි ජන බලවේගයේ, සමගි ජන සන්ධානයේ සංවිධායකවරුයි පමණයි කියන එක කනගාටුවෙන් වුවත් මතක් කරන්න ඕනෑ.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ඒක නම් අසත්‍යයක්. සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. විපක්ෂ නායකතුමනි, මමත් ඒකට සම්බන්ධ වුණා. අපට අසාධාරණයක් කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු මන්ත්‍රීතුමනි, මට සමාවෙන්න. මගෙන් පොඩි අඩුපාඩුවක් වුණා. ගරු වීරසුමන වීරසිංහ මැතිතුමා ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා. මට සමාවෙන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් නිරන්තරයෙන්ම මේ කාරණාව කථා කළා. විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඇත්ත කථා කරන්න. අපි මේ ගැන අවුරුදු තුනක් තිස්සේ කථා කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා යන්න ඇත්තේ ගිය සතියේ වෙන්න ඇති. හැබැයි, මාතර දිස්ත්‍රික්කයේ ඉන්න පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු සියලුදෙනා එතැනට ගිහිල්ලා තිබෙනවා.

ඩලස් අලහප්පෙරුම හිටපු ඇමතිතුමාත් එතැනට ගියා. ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාත්, ගරු කථානායකතුමාත් ගියා. විපක්ෂ නායකතුමා ගිය සතියේ ඒ ස්ථානයට ගියාට අපිත් ඒ ගැන කථා කරලා තිබෙනවා. හැබැයි, ඒ ගැටලුව විසඳන්න දේශපාලන තීන්දු ගන්න බැහැ, තාක්ෂණික තීන්දු ගන්න ඕනෑ. ඔබතුමාට ගිහිල්ලා දේශපාලන තීන්දු දෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කරුණාදාස කොඩිතුවක්කු මන්ත්‍රීතුමා, ඔබතුමාටත් ඒ සම්බන්ධ කාරණාවක් ද කියන්න තිබෙන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අවසන් නැහැ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලබල වෙන්න එපා. හොඳයි, ඒ ස්ථානයට ඒ අය ගියාය කියමුකෝ. හැබැයි, 2019 දී බලයට පත් වුණු ජනාධිපතිවරයා 2020 දී පාර්ලිමේන්තුව,-

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා point of Order එකක් මතු කරන්න තමයි අවස්ථාව ඉල්ලන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අවසන් කරලා ඉන්න ඕනෑ.

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඊයේත් ගිහිල්ලා ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයුවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට, දිසාපතිතුමාට කථා කරලා අවශ්‍ය කෑම-බීම ටික ලබා දුන්නා, වියළි ආහාර ටික ලබා දුන්නා. විපක්ෂ නායකතුමනි, අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ සිටින වීරසුමන වීරසිංහ මැතිතුමාගේ ප්‍රකාශය භාර ගන්න මම සූදානම්. හැබැයි, මේ දැන් නැඟිටලා කෑ ගැහුවා, රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු. මම අහන්න කැමැතියි, අඩුම ගානේ කන්න 9ක් පාඩු විඳිනකල් වගා හානි දීලා තිබෙනවාද කියලා. වගා හානි දුන්නාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ දීලා නැහැ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒකට උත්තර දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිකම් බොරුවට කයිවාරු ගහලා වැඩක් නැහැ නේ. වගා හානි දීලා නැහැ. අපි හිතමු, ලවණ බාධක ව්‍යාපෘතිය සාර්ථක කරගන්න යම් කාලයක් යයි කියලා. හරි, ඒක සාධාරණයි. ඒකට යම් කාලයක් යනවා. හැබැයි, වගා හානි දීලා නැහැ නේ. ඒකයි ඇත්ත කථාව. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවදාද, වගා හානියට වන්දි ලබා දෙන්නේ? කන්න නවයකට පිට පිටම වන්දි ගෙවලා නැහැ. මන්ත්‍රීවරු ඒ ස්ථානය බලන්න ගියාය කියලා කියනවා නම්, ගියා කියලා මම පිළිගන්නම්. අපේ කංචන විජේසේකර ඇමතිතුමාත් කිව්වා නේ ගියා කියලා. ගරු කථානායකතුමාත් කිව්වා නේ, ගියා කියලා. හරි, ඒක මම පිළිගන්නම්. හැබැයි, කෝ වන්දි ටික? කවදාද ඒ වන්දි ටික ලබා දෙන්නේ?

06. ලවණ බාධකයේ බලපෑම සහ නොනැවතී පවතින අධික වර්ෂාව හේතු කොටගෙන අද වන විට නිල්වලා ගඟ ආශ්‍රිත ප්‍රදේශ රැසක් දින ගණනාවක් තිස්සේ ගංවතුරෙන් යට වී තිබෙනවා. මේ නිසා දැනටමත් විපතට පත් ජනතාව වෙනුවෙන් රජය ලබා දෙන සහන මොනවාද? මෙම ගංවතුර තත්ත්වයෙන් එම ප්‍රදේශ මුදා ගැනීම සඳහා රජය ගනු ලබන කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන පියවර කවරේද?

මම කංචන විජේසේකර ඇමතිතුමාට කියන්න කැමැතියි, ඒක දේශපාලන තීන්දුවක් නොවෙයි, තාක්ෂණික තීන්දුවක් කියලා. ඒක ඉංජිනේරුවන් විසින් ගෙන තිබෙන තීන්දුවක්.

07. ලවණ බාධකයේ වැරැදි නිවැරදි කරලීම සඳහා අතුරු ඇළ මාර්ගයේ අඩි 40ක් පළලට sheet piles ගලවා ඉවත් කළ යුතු බව තීරණය කර තිබෙනවා. එම sheet piles ගලවා ඉවත් කිරීම සඳහා කොපමණ කාලයක් ගත වේද? කොපමණ මුදලක් වැයවේද? එම වැයවන මුදල් ප්‍රමාණය කඩිනමින් ලබා දීමට රජය කටයුතු කරන්නේද? නැතහොත් ජලසම්පාදන අමාත්‍යාංශය හා වාරිමාර්ග අමාත්‍යාංශය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් නොමැති නිසා හටගෙන ඇති මෙම ගැටලුව විසඳීමට රජය සතුව ඇති විකල්ප වැඩ පිළිවෙළ කවරේද? මොකක්ද විසඳුම?

මෙතැන නිකම් කයිවාරු ගහලා වැඩක් නැහැ නේ. ඇමතිකම් හොබවනවා, කථානායක ධුර හොබවනවා, රාජ්‍ය පාර්ශ්වය ඉන්නවා, රාජ්‍ය බලයට ප්‍රවේශය තිබෙනවා. ඒවා උපයෝගි කරගෙන මේකට ලබා දෙන විසඳුම මොකක්ද?

08. ප්‍රදේශයේ ජනතාවට ලවණවලින් තොරව පානීය ජලය ලබා දීමටත්, ගොවි ජනතාවට අවශ්‍ය ජලය කළමනාකරණය කර ලබා දීමටත් රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

මේ ප්‍රශ්නවලට උත්තර ලබා දෙන්න කියලා මම බොහොම ගෞරවයෙන් රජයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම කියැවුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ නම කිව්වේ කවුද? විපක්ෂ නායකතුමාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිනේෂ් ගුණවර්ධන වර්තමාන අගමැතිතුමා 2010-2015 වකවානුවේ ජල සම්පාදන ඇමතිවරයා විධියට ඉන්නකොට වාරිමාර්ග රාජ්‍ය ඇමති විධියට කටයුතු කළේ ඩබ්ලිව්.බී. ඒකනායක මහත්මයා. මට මතක හැටියට, එතුමා දැන් වාරිමාර්ග ඇමතිතුමා ඉන්න තැන තමයි ඉඳගෙන හිටියේත්. එතුමා නියෝජනය කළේ අනුරාධපුරය දිස්ත්‍රික්කය.

2013දී තමයි ඉස්සෙල්ලාම මේ ලවණ බාධකය කියන කාරණය කථා වුණේ. ඒක හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා, බලන්න පුළුවන්. මම 2011දී -අවුරුදු 12කට කලින්- තමයි මේ ගැන ඇහුවේ. එදා මේ ගැන විවිධ කථා කිව්වා. අද වෙනකොට තුඩාව, මාගොල්ලාගොඩ, තල්ගහගොඩ කියන පොම්පාගාර 3ම අක්‍රිය වෙලා තිබෙනවා. සැප්තැම්බර් 2වැනි දා ගලපු වතුර තවම බැහැලා නැහැ. දැන් ඔක්තෝබර් 2වැනි දාත් පහුවෙලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මේ වෙනකොට ඒ ප්‍රදේශවල ගොවීන් වපුරපු වී ටික විනාශ වෙලා තිබෙනවා. දහවැනි වතාවටත් දැන් වගාව පාළුවෙලා තිබෙනවා. කංචන විජේසේකර ඇමතිතුමනි, මේ ගොවීන්ට කන්න 10ක් නැති වුණා. ලවණ බාධකයෙන් පස්සේ කන්න 2ක් නැති වුණා. ඊට කලිනුත් නැති වුණා. ඒ ව්‍යාපෘතියට මුල් ගල තබන වකවානුවේදී මම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා විධියට කටයුතු කළා. අපි ලබා දුන්නා regulatory gate system එකක් එක්ක තිබෙන ක්‍රමය. හැබැයි, ඒක 2020දී වෙනස් කළා කියලා ගිය සතියේ ඉංජිනේරු මහත්වරු කිව්වා. ඒ වාගේම මම කියන්න ඕනෑ, ඩීසල් නැති නිසා පොම්පාගාරවල කටයුතු අක්‍රිය වෙලා තිබෙන බව. ගරු ඇමතිතුමනි, ඩීසල් උස්සන වංචාවක් සිද්ධ වෙනවා. ඔබතුමා ඒ ගැන සොයා බලන්න. ඔළුව වනන්න එපා, ඔබතුමා ඒ ගැන හොයා බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න. මේක ඔබතුමාගේ අවස්ථාව නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ඔබතුමා නිලධාරින් කියන කාරණා මත තීන්දු ගන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාව ඉතුරු කරන්න ඕනෑ නිසා මේ මොහොතේ මම **සභාගත*** කරනවා, ඊයේ දින දක්වා වාර්තා වූ ආපදා සිද්ධි පිළිබඳව මාතර දිස්ත්‍රික් ලේකම්වරයා නිකුත් කළ වාර්තාවක පිටපතක්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බුද්ධික පතිරණ මහතා]

එම වාර්තාව අනුව පවුල් 1,982ක් ආපදාවට ලක් වී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් තිබෙන බව. ඒ 16ම ගංවතුර ආපදාවට ලක් වෙලා තිබෙනවා. මේවා කියන්නේ මම නොවෙයි, මාතර දිස්ත්‍රික් ලේකම්වරයා. ගංවතුර නිසා නිවාස 161කට හානි සිදු වී තිබෙනවා. වෙනත් දේපළ හානි 35ක් වාර්තා වෙලා තිබෙනවා. මේ නිසා විපතට පත් පවුල්වල සාමාජික සංඛ්‍යාව 7,721ක්. නමුත්, තවම ඒ අයට වතුර බෝතලයක්වත් ලැබිලා නැහැ. වන්දි දුන්නා කියා අරක-මේක කිව්වාට, එක පැත්තකින් ඔවුන්ට වගා හානි සඳහා වන්දි ලැබිලාත් නැහැ. අනෙක් පැත්තෙන් මේ මොහොතේ ගංවතුර ආපදාවට ලක් වෙලා ඉන්න මිනිස්සුන්ට වතුර, කෑම සපයා ගන්න විධියකුත් නැහැ. මොකද, මාතර දිස්ත්‍රික්කයේ සමහර පැතිවල තිබෙන්නේ දූ-කුට්ටි. එම දූ-කුට්ටි වටේටම වතුර පිරිලා. ඒවා මැද තිබෙන්නේ ගංගොඩවල්. ඉතින් ඒවායේ ඉන්න මිනිස්සුන්ට වතුර ටිකක් ගන්න, කෑම ටිකක් ගන්න යන්න එන්න විධියක් නැහැ. මේක තමයි යථාර්ථය.

මම හිතන විධියට ඔබතුමන්ලා අද සවස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ ගැන සාකච්ඡාවක් පවත්වනවා. අපි ඒක අගය කරනවා. හැබැයි, මෙන්න මේ වාර්තාව මත පදනම්ව කෙටි කාලීනව යම් කිසි පියවරක් ගත යුතුයි. දැන් මේ ගංවතුර උවදුර වැඩි වෙන්නේ ලවණ බාධකය නිසායි. ඒ නිසා ඒකට යම් ක්‍රමයක් සැදීමට මධ්‍ය කාලීන, දිගු කාලීන වැඩ පිළිවෙළක් ගෙනෙන්න ඕනෑ. එතෙක් මේකට වෙන විකල්පයක් නැහැ. ඒ නිසා වෙන මොන සුන්දර කථා කිව්වත්, ඒකයි මේ මොහොතේ තිබෙන තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය තවත් කාරණයකට යොමු කරනවා. මම මේ කියන දේ සිද්ධ වෙන්නේ අකුරැස්සේ. කරුණාදාස කොඩිතුවක්කු මන්ත්‍රීතුමාට හා වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාටත් මේ ගැන කියන්න ඕනෑ. මේ වෙනකොට අකුරැස්සේ සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරියකු නිසා බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එම නිලධාරියා ඉතා අසභ්‍ය විධියට පුද්ගලයන්ට බැණ වදිනවා. මේ කාරණයේදී අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් ඇතුළු අනෙක් සියලුදෙනා නිහඬ වෙලා තිබෙනවා. ඒ අය එවැනි නිලධාරින් රකිනවා මිසක්, අහිංසක සමෘද්ධිලාභියා රකින්නේ නැහැ. මාතර දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු දුසිම් ගණනක් තිබෙනවා. හැබැයි, අකුරැස්සේ මේ කියන සමෘද්ධි බැංකුව හැර වෙන කිසිම තැනක මේ වාගේ අර්බුද ඇති වෙලා නැහැ. එම පුද්ගලයා මාධ්‍යකරුවන්ට තර්ජනය කරනවා, කුණුහරුපයෙන් බණිනවා. ඒ වාගේම සමෘද්ධිලාභීන්ට ඒ අයගේ බැංකු පොත්වල තිබෙන මුදල් ගන්න ඉඩ දෙන්නේත් නැහැ. ගංවතුර ආපදාවට අමතරව මේ වාගේ ප්‍රශ්නත් ආවාම අලි මදිවට කොටි කියනවා වාගේ ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ අලකළංචියට යම් කිසි සාධනීය මැදිහත්වීමක් කරන්න ඕනෑ. මම දන්නා විධියට ගරු කථානායකතුමා ලංකාවට එන්නේ ලබන ඉරිදා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක් හරි දැඩි ක්‍රියාමාර්ගයක්, කඩිනම් ක්‍රියාමාර්ගයක් මේ කාරණා දෙකම වෙනුවෙන් ගත යුතුව තිබෙනවා. තරාතිරම නොබලා එවැනි සමෘද්ධි නිලධාරින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කවුරු හෝ මේ වැරදිකරුවන් රකිනවා නම් ඒ අයට විරුද්ධවත් නිසි ක්‍රියාමාර්ග ගන්න. [බාධා කිරීමක්]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කංචන විජේසේකර ඇමතිතුමනි, ගංවතුර පිළිබඳව මෙවැනිම ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට අපේ වීරසුමන වීරසිංහ මැතිතුමා ලිඛිතව මූලාසනයෙන් අවසරයක් ඉල්ලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමාට ඉන් පසු අවස්ථාව දෙනවා. වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා ලිඛිතව මූලාසනයෙන් ඉල්ලපු අවසරය, මේ අවස්ථාවේ ඔබතුමාට ලබා දෙනවා. කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කංචන විජේසේකර මැතිතුමා මගේ දිස්ත්‍රික්කයේ වර්තමාන දේශපාලන නායකත්වය දරනවා. එතුමාත් මෙතැන ඉන්න නිසා මම මේ ගැන කියන්න කැමැතියි. මෙය ඉතාම සංවේදී ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට ගරු කථානායකතුමාගෙන් මම ලිඛිතව අවසර ඉල්ලා සිටියා. ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ මූලික අවධානයත් මේ කාරණය කෙරෙහි මා යොමු කරවනවා. මෙය බරපතළ ප්‍රශ්නයක්. විපක්ෂ නායකතුමා දැන් මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීමක් කළා. නමුත්, ඒ ලවණ බාධකය සම්බන්ධ කාරණාව ගැන අපි පසුගිය කාල පරිච්ඡේදය තුළ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා.

මට මතකයි, 2022 මාර්තු මාසයේ 4වැනි දා තමයි ඒ සියලු පාර්ශ්ව ගෙන්වා සාකච්ඡාවක් කරන්න අපි කටයුතු කළේ. එදා තමයි විමල් වීරවංශ මැතිතුමා ඇතුළු කණ්ඩායම ඇමති මණ්ඩලයෙන් ඉවත් කළේ. එම නිසා මට ඒ සාකච්ඡාවට සහභාගි වෙන්න බැරි වුණා. එදා ඉඳන් මේ කාරණා ගැන අපි දිගින් දිගටම කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාගේ ප්‍රශ්නයකට අදාළව මම අතුරු ප්‍රශ්නයක් ඇහුවා. ජලසම්පාදන අමාත්‍යාංශයත් සාධාරණයි. කරදිය මිශ්‍රවීම වැළැක්වීමට කරදිය බාධකයක් අවශ්‍යයි. නමුත්, එය ඉදිකරපු ක්‍රමය ගැන සහ තාක්ෂණික කාරණා ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් කරඇරලා ඉන්නවා. එම නිසා පරිසර අමාත්‍යතුමාගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අසමින් මම කිව්වා, සාධාරණ මැදිහත් වීමක් කරලා ඒ කටයුත්ත කරන්න කියලා. ගරු නසීර් අහමඩ් ඇමතිතුමා මීට අවුරුද්දකට කලින් අමාත්‍යාංශයේ සියලු නිලධාරින් ගෙන්වා මේ සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් කළා. අවාසනාවකට, පසුගිය කාලයේ සිදුවුණු දේවල් එක්ක ඒ සියල්ල පැත්තකට ගියා. මේක අද-ඊයේ මතු වුණු ප්‍රශ්නයක් නොවෙයි, දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ මේ ගංවතුර ප්‍රශ්නය ඉතා බරපතළ ප්‍රශ්නයක් නිසායි.

El Niño කියන කාලගුණ විපර්යාසය තුළ අධික ගංවතුර සහ අධික නියඟය කියන තත්ත්ව දෙකම ඇති වෙන්න පුළුවන්. දැන් අපට ඇති වෙලා තිබෙන්නේ අධික ගංවතුර තත්ත්වයක්. අද, හෙට, අනිද්දා වර්ෂාව තවත් වැඩි වෙනවා කියන එක තමයි ජාත්‍යන්තරයෙනුත්, ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙනුත් වාර්තා කරන්නේ. ඒකෙන් පීඩාවට පත්වන මිනිස්සු ගැන අපි නිකම් බොරුවට අර පැත්තට, මේ පැත්තට ඇඹිල්ල දිගුකරලා වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාගේ දිස්ත්‍රික්කයට ඉතිහාසයේ වැඩිම වර්ෂාපතනය ඊයේ-පෙරේදා ලැබුණා; මිලිමීටර 260 ගණනක වර්ෂාවක් ඊයේ හම්බන්තොට දිස්ත්‍රික්කයට ලැබුණා. අද වෙනකොට තංගල්ල පැත්ත යට වෙලා. එම නිසා මේක එක දිස්ත්‍රික්කයකට විතරක් නොවෙයි, ලංකාවටම බලපාන ප්‍රශ්නයක්.

මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. තවමත් මේ තත්ත්වය ආපදා තත්ත්වයක් විධියට වාර්තා කරලා නැහැ. ගරු අගමැතිතුමනි, එම නිසා මේ වෙනුවෙන් කටයුතු කරන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තවම රුපියලකවත් මුදලක් ලැබිලා නැහැ. වෙන දා ගංවතුර තත්ත්වයක් ඇති වුණාම එයට කොටු වෙච්ච මිනිස්සුන්ට පිසූ ආහාර ටික දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යවනවා; වියළි ආහාර ටික දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන යවනවා. දිස්ත්‍රික් ලේකම්තුමා බලය පාවිච්චි කරලා මොනවා හරි ටිකක් දෙන්න කියලා ප්‍රාදේශීය ලේකම්ලාට කියනවා හැරෙන්න මාතර දිස්ත්‍රික්කයට අද වෙනතුරු කිසිම ප්‍රතිපාදනයක් මේ ආපදාව වෙනුවෙන් වෙන් වෙලා නැහැ. අනෙක් ප්‍රදේශවල තත්ත්වයත් එහෙමයි. දවස් 21කට පස්සේ, ඊයේ තමයි බත් පැකට් එකක් මාලිම්බඩ පැත්තට, කද්දුව පැත්තට ලැබුණේ. ඒ මිනිස්සුන්ට තිබෙන දේවල්වත් උයාගෙන කන්න විධියක් නැහැ. සල්லි තිබෙන මිනිස්සුන්ට බඩු ටිකක් ගෙනෙන්න යන්න විධියක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හුංගන්ගොඩ ලවණ බාධකය නිසා බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධව ක්ෂණික මැදිහත් වීමක් කරන්න අවශ්‍යයි. ගංවතුර බැහැලා ගියත්, වැස්සේ නැතත් ආපදාවට ලක් වූ මිනිස්සු ඒ පරිප්පුව කනවා. දෙනියාය පැත්තට වහිනකොට ඒ වතුර ටික ඇවිල්ලා ටැංකි වාගේ පිරිලා මේ ප්‍රදේශවල දවස් ගණනක්, මාස ගණනක් තිබෙනවා. මේ ප්‍රදේශ වතුරෙන් යටවෙලා දැන් දවස් 21ක් වෙනවා. මේ ප්‍රදේශවල තිබුණු කුඹුරු අක්කර 12,000ක් සම්පූර්ණයෙන් ඉවරයි. එම නිසා ඒ ලවණ බාධකය ගැන විධිමත් තීන්දුවක් ගන්න අවශ්‍යයි. ඒ තකතීරු තීන්දු ගත්ත නිලධාරීන්ට දඬුවම් දෙන්න කියන කාරණාවත් මේ අවස්ථාවේදී මම සිහිපත් කරනවා. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක් ගංවතුරෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. ගරු කංචන විජේසේකර ඇමතිතුමා ඒ ගැන හොඳටම දන්නවා. මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව මීට පෙර කවදාවත් ඇති නොවූ ගංවතුර තත්ත්වයකට මේ වන විට මුහුණ දී සිටිනවා. පඹුරණ, පරමුල්ල, වේරගම්පිට, පිලදුව, තුඩාව, හිත්තැටිය කියන සියලු තැන් මේ වන විට ජලයෙන් යට වෙලා. හෙට-අනිද්දා වෙනකොට මේ ප්‍රදේශවල ජල මට්ටම තවත් වැඩි වෙයි. අඩුම ගණනේ සතියක් හමාරක් මේ වතුර ටික රැඳේවි. ඒක නිසා ඒ මිනිස්සුන්ට උදව් කරන්න. ඒ වාගේම තිහගොඩ, මාලිම්බඩ, අතුරලිය, පිටබැද්දර, අකුරැස්ස, කඹුරුපිටිය කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල විශාල පිරිසක් පීඩාවට පත් වෙලා සිටිනවා.

ගරු අගමැතිතුමනි, දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට කියන්න, එම ජනතාවට වහවහාම සහන ලබා දෙන්න කියලා.

දැන් තවත් ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ ප්‍රදේශවල වතුර මට්ටම තිබෙන්නේ අඩි 10ක් 15ක් නොවෙයි. එම නිසා Navy එකේ බෝට්ටුවකට යන්න බැහැ, සහන කටයුතුවලට. මේ සඳහා අවශ්‍ය වෙන්නේ අඟුළ. අද මාතර දිස්ත්‍රික්කයේ අඟුළු නැහැ. වතුරට බැහැලා මිනිස්සුන්ට යන්න බැහැ. ගරු කංචන විජේසේකර ඇමතිතුමනි, නිල්වලා ගඟේ ඉන්න කිඹුල්ලු සේරම දැන් ගොඩබිමට ඇවිල්ලා. ඒක නිසා මිනිස්සුන්ට වතුරට බහින්න විධියක් නැහැ. ඒ නිසා කොහේ හෝ තිබෙන තැනකින් අඟුළු ටිකක් දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ වාගේම පීඩාවට පත් වූ ජනතාවට අවශ්‍ය ආහාර ටික ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න. මේ කාරණා සම්බන්ධව ඔබතුමා සෘජු මැදිහත් වීමක් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පස් කඳු කඩා වැටිලා පාරවල් බොහෝ ප්‍රමාණයක් අවහිර වෙලා තිබෙනවා. ප්‍රවාහන හා මහාමාර්ග ඇමතිතුමාගෙන් අපි ඊයේත් ඉල්ලුවා, ඒවා ප්‍රතිසංස්කරණය කර දෙන්න කියලා. ප්‍රාදේශීය සභා ක්‍රියාත්මකව තිබුණා නම් මේ අවස්ථාවේදී මෙච්චර ප්‍රශ්න ප්‍රමාණයක් එන්නේ නැහැ. පළාත් පාලන ආයතන ටික ක්‍රියාත්මක මට්ටමේ තිබුණා නම් සියලුදෙනාගේ සක්‍රිය මැදිහත්වීමෙන් මේ ජනතාවට අවශ්‍ය ආහාර ටික, ප්‍රවාහන පහසුකම් ටික සපයනවා. ගරු අගමැතිතුමනි, පළාත් පාලන ආයතනවල සිටින ලේකම්වරු තීන්දු ගන්න බයයි. අද බැකෝ එකකට තෙල් ටික දීලා පාර සුද්ද කරන්න යවන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුකාරවරුන් හරහා පළාත් පාලන ආයතනවලට බලය දෙන්න, මේ සම්බන්ධව නිසි තීන්දු ගන්න කියලා. පළාත් පාලන ආයතන, පළාත් සභා සහ දිස්ත්‍රික් ලේකම්වරු හරහා ඒ අවශ්‍ය පියවර වහවහාම ගන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගංවතුර තත්ත්වය ඉතාම කඩිනමින් ඇති වෙච්ච ප්‍රශ්නයක්. මාතර දිස්ත්‍රික්කය පිළිබඳව අවබෝධයක් තිබෙන පුද්ගලයෝ දන්නවා, මීට පෙර කවදාවත් යට නොවුණු ප්‍රදේශත් මේ අවස්ථාවේ ගංවතුරට යට වෙලා තිබෙන බව. විශේෂයෙන්ම ගත්තොත් දන්දෙනිය, වලස්ගල, වත්තේගම හා රදම්පල වැනි ප්‍රදේශවලට ගංවතුර තත්ත්වක් ඇති වුණේ අවුරුදු 20කට විතර පසුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර නිල්වලා ගඟ හරහා ඉදිකර ඇති ලවණ බාධකය බලන්න විපක්ෂ නායකතුමා පසුගිය සතියේ යන්න ඇති. නමුත්, මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයන් ඒ පිළිබඳව නිලධාරීන්ට, ඒ වාගේම අදාළ අමාත්‍යාංශවලට හා අදාළ ආයතනවලට දිගින් දිගටම කරුණු දන්වලා තිබෙනවා. ඒ පිළිබඳව 2019, 2020, 2021 හා 2022 අවුරුදුවල සාකච්ඡා පවත්වලා තිබෙනවා.

ගරු රොෂාන් රණසිංහ ඇමතිතුමාත්, ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමාත් ගිය අවුරුද්දේ ඇවිල්ලා ඒ පිළිබඳව සාකච්ඡා පවත්වලා තිබෙනවා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ. නමුත්, එය දේශපාලන වශයෙන් ගන්න පුළුවන් තීන්දුවක් නොවෙයි. ඒ ලවණ බාධකය පිළිබඳ ගැටලුවේදී එක පැත්තකින් කුඹුරුවලට වාගේම, අනෙක් පැත්තෙන් පානීය ජලයටත් බලපාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තීන්දුව තාක්ෂණික වශයෙන් ගත යුතු තීන්දුවක්. විපක්ෂ නායකතුමා ඒ පිළිබඳව අවබෝධයක් නැතුව කථා කිරීම පිළිබඳව අප කනගාටු වනවා. ගරු බුද්ධික පතිරණ මැතිතුමාත් කිව්වා, 2011දීත් මේ ප්‍රශ්නය මතු කළා කියලා. 2011දීත් ඒ ප්‍රශ්නයට විසඳුමක් ලැබිලා නැහැ. 2015 ඉඳන් 2019 වන කල් බලයේ හිටියේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම නියෝජනය කරපු ආණ්ඩුව. හැබැයි, ඒ වෙලාවේත් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න බැරි වුණා. ඒක තමයි යථාර්ථය. මේ ප්‍රශ්නයට තාවකාලික විසඳුම් දෙන්න බැහැ. මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් දෙන්න ඕනෑ. මේ පිළිබඳව ප්‍රාදේශීය දේශපාලන නායකයන් සියලුදෙනා කථා කරලා තිබෙනවා. මේක දේශපාලන ප්‍රශ්නයක් බවට පරිවර්තනය කර ගන්න එපා. සමගි ජන බලවේගයේ ඉන්න සංවිධායකවරු ඇතුළු අපි ඔක්කෝම ගිහිල්ලා ඒ ස්ථානය බැලුවා. "ඒක බලන්න ගියේ අපි විතරයි" කියලා නිකම් ප්‍රාථමික දේශපාලනයක් කරන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරනවා නම්, විපක්ෂ නායකවරයාගේ දේශපාලන අවබෝධය අපට වැටහෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගංවතුර තත්ත්වය සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාවල ඉන්න කොමසාරිස්වරු මේ වන

[ගරු කංචන විජේසේකර මහතා]

විට කටයුතු කරනවා. මුදල් ප්‍රමාණවත් නැහැ කියලා අපි කියලා නැහැ. අවශ්‍ය මිලදී ගැනීම් කරන්න, ඒ සඳහා අවශ්‍ය මුදල් රජයෙන් ලබා දෙන්නම් කියලා අපි කියලා තිබෙනවා. අද උදෑසනත් මම දිස්ත්‍රික් ලේකම්තුමාට කථා කළා. ඒ අවශ්‍ය සියලු සම්පාදන කටයුතු කරනවා. යන්න බැරි සමහර ස්ථාන තිබෙනවා. වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සමහර ස්ථානවලට යන්න බැහැ, ගංවතුර තත්ත්වය අඩු වෙනතුරු ඉන්න වෙනවා. ඒ පාරවල් වැහිලා තිබෙන්නේ. ඒ නිසා ප්‍රාදේශීය සභාවලටත් අපි උපදෙස් ලබා දීලා තිබෙනවා, ඔවුන්ට තිබෙන සියලු සම්පත් පාවිච්චි කරලා මේ කටයුතු කරන්න, මදිපාඩුවක් තිබෙනවා නම් ඒකට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා රජය මැදිහත් වෙලා මුදල් ප්‍රතිපාදන දෙන්නම් කියලා. ඊට අමතරව වැරැදි මතයක් දැන් මෙතැනදී කියැවුණා, පොම්පාගාරය ඩීසල් නැතුව දැන් නැවතිලා තිබෙන්නේ කියලා. ඊයේ වෙනකොටත් මේ කටයුතු කරන්න වාරිමාර්ග අමාත්‍යාංශයෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 15ක් ලබා දීලා තිබෙනවා. අද උදෑසනත් මම ඒ ගැන විමසුවා. ඔවුන්ට තවත් බවුසරයක් standby තිබෙනවා. දැනටත් පොම්පාගාර තුනකින් ජලය ඉවත් කිරීමේ කටයුතු කර ගෙන යනවා. ඒ කටයුතු අඩාළ වෙලා නැහැ. ඒ වාගේම, ඔවුන්ට ඉන්ධන අවශ්‍ය නම්, ඒ සඳහා මුදල් නැත්නම්, මාතර තිබෙන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩාවෙන් ණය ක්‍රමයට ඉන්ධන ලබා ගන්න අපි පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ නිසා කිසිම බියක් ඇති කර ගත යුතු නැහැ, මේ පොම්පාගාර අක්‍රිය වෙලා තිබෙන්නේ කියලා. මේ වෙනුවෙන් ගන්න පුළුවන් හැම තීන්දුවක්ම රජය අරගෙන තිබෙනවා.

හැබැයි, අපි සියලුදෙනාම මේ තත්ත්වය අවබෝධ කර ගත යුතුයි. නියං තත්ත්වයක් තිබිලා එක පාරට ගංවතුර තත්ත්වයක් එනවා. ඒ වාගේ තත්ත්ව තුළ තීරණ ගැනීමේදී අපට විවිධ ක්‍රම තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභාවලට හා පළාත් සභාවට මේ වෙන කොට ලබා දෙමින් තිබෙනවා. අද සවස 5.00ට අපි සාකච්ඡාවක් යොදා ගෙන තිබෙනවා. ඔබතුමන්ලාත් කැමැති නම් ඒ සාකච්ඡාවට එන්න. අපි කියනවා, අවශ්‍යතා කියන්න කියලා. ඒ අවශ්‍යතා අනුව අපි මේ වෙලාවේත් ඒ වැඩ පිළිවෙළ කරනවා. ඒ නිසා ජනතාව තුළ අනවශ්‍ය මතයක්, බියක් ඇති කරලා, "මේ පොම්පාගාර අක්‍රිය වෙලා තිබෙන්නේ, මේ ලවණ බාධකය දැන් කඩා ගෙන යන්න පුළුවන්, ඒක නිසා මහා විනාශයක් වෙන්න පුළුවන්" කියලා අසත්‍ය තොරතුරු නම් දෙන්න එපා කියලා අපි කියනවා. ඒ වාගේම, ලවණ බාධකය කොහොමද හදන්නේ කියලා අපට දේශපාලන තීන්දු ගන්න බැහැ. ඒක අපට දේශපාලනිකව කරන්න බැහැ. ඒක තාක්ෂණික වශයෙන් නිලධාරින් කළ යුතු දෙයක්. නිලධාරින්ගෙන් යම් අත් වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශය කටයුතු කරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට චෝදනාවක් එල්ල කළා, මේ තොරතුරු, කරුණු කාරණා නොදැන කථා කරනවා, බොහොම ප්‍රාථමික දේශපාලනයක් කරනවා කියලා. කන්න නවයක් පිට පිට හානි වීම, දහස් ගණනක් ගොවීන්ට වන්දි ලබා නොදීම ප්‍රාථමික කාරණයක් හැටියටයි මම දකින්නේ. කන්න නවයක් වගා හානි වෙනතුරු මේ රජය නියෝජනය කරන ඇමතිවරු පොල් ගෑවාද කියලා මම අහන්න කැමැතියි. අපි පිළිගන්නවා, ලවණ බාධකය කියන ප්‍රශ්නයට තාක්ෂණික වශයෙන් තිරසර විසඳුමක් අවශ්‍යයි කියන එක. අපි ඒක පිළිගන්නවා. ඒ විසඳුම ලබා දෙන්න. නමුත්, කන්න නවයක් වගා හානි වෙනතුරු මොනවාද මේ ගොල්ලන් කළේ? මමයි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමායි එතැනට ගිහිල්ලා අපේ සංවිධායකවරු එක්ක සාකච්ඡාවක් පවත්වලා, ජනතාවත් ගෙනැල්ලා සාකච්ඡා කරලා, අද මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇහුවාම තමයි නිදා ගෙන හිටපු මේ මහා දේශපාලන යෝධයෝ නැඟිටලා තිබෙන්නේ. අපියි අවදි කළේ. මේ ගොල්ලෝ බුදියාගෙනයි හිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න බලධාරියෙක් ඉදිරිපත් වෙන්න ඉස්සෙල්ලා වෙන වෙන අයට අවස්ථාව ලබා දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීතුමාට තමයි ඉස්සෙල්ලාම අවස්ථාව ලබා දුන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දීර්ඝ කාලීන, මැද කාලීන විසඳුමකට තාක්ෂණය අවශ්‍යයි කියලා පිළිගන්නවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. එතකොට වගා හානිවලට වන්දි කෝ? කන්න නවයක් පිට පිට හානි වුණා. මේ කථා මොන විහිළුද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමනි, *[බාධා කිරීමක්]* ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයට ඔබතුමා අද පිළිතුරු ලබා දෙනවාද?

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சஷீந்திர ராஜபக்ஷ)
(The Hon. Shashindra Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට හෙට පිළිතුරු ලබා දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දැන ගන්න. ඇත්තටම ඔබතුමන්ලාටත් අවබෝධයක් නැහැ නේ. මේ ලවණ බාධකය ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රධානතම වග කිව යුතු ආයතනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - National Water Supply and Drainage Board. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒක ඉදිකරලා තිබෙන්නේ, වාරිමාර්ග අමාත්‍යාංශයේ අවවාද හා උපදෙස් ලබාගෙන. මේ හැමෝටම දැන් පොට වැරැදිලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය, වාරිමාර්ග අමාත්‍යතුමා විතරක් උත්තර දෙන්න ඕනෑ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, එතුමා,-[බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමා කිව්වේ, "වාරි" කියලා නේ. "වාරි" විතරක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වෙනදාත් ඔබතුමාගේ ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නවලට ඇමතිවරු තුන්දෙනාම උත්තර දීලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විෂය දන්නේ නැහැ කිව්වා නේ. මම හොඳට විෂය දන්නවා. මම විෂය නොදැන කථා කරන්නේත් නැහැ. මම හොඳ අවබෝධයක් ලබාගෙනයි කථා කරන්නේ. මේක වාරිමාර්ග අමාත්‍යාංශයයි, ජල සම්පාදන අමාත්‍යාංශයයි දෙගොල්ලන් එක්කහු වෙලා කරන්න ඕනෑ වැඩක්. නමුත්, කෙරෙන්නේ නැහැ. අනෙක් එක- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. වගා හානිවලට වන්දි දෙන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයයි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. එතකොට මේක අමාත්‍යාංශ හතරක් එක්කහු වෙලා උත්තර දෙන්න ඕනෑ ප්‍රශ්නයක්.

**ගරු සනත් නිශාන්ත මහතා (ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனத் நிசாந்த - நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha - State Minister of Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම විපක්ෂ නායකතුමා ගෙනා චෝදනාව මම ප්‍රතික්ෂේප කරනවා. එතුමා විතරයි සුදුම සුදු. අනෙක් අය කළුම කළුයි. "වෙන කවුරුත් එතැන බලන්න ගියේ නැහැ, මම විතරයි බලන්න ගියේ" කියලා කථාවක් නේ දැන් කිව්වේ. නිපුණ රණවක මන්ත්‍රීතුමාගේ ඉල්ලීමක් පරිදි මම නිලධාරින් සමඟ පෞද්ගලිකව මේ ලවණ බාධකය බලන්න ගියා. මේ ලවණ බාධකය ඉදිකරන්නේ නිකම්ම නිකම් සිල්ලර විධියට නොවෙයි, කොරියානු සමාගමක් විසින් කොරියානු තාක්ෂණයට අනුව. ඒක ඉතාම සංවේදී කාරණයක්. පුළුවන් නම් ඔබතුමා නැඟිටලා කියන්න, ගංවතුර ප්‍රශ්නයක් තිබෙනවා. ගොවීන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. බොන්න වතුර එපා, මේ බාධකය අයින් කරන්න කියලා. එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. මොකද, මේක මාතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි හම්බන්තොට දිස්ත්‍රික්කයටත් පානීය ජලය ගෙන යන ඉතාම සංවේදී ස්ථානයක්. මේ නිසා යාය යට වෙනවා කියලා දැන් ගොවියෝ කෑ ගහනවා වාගේම, පහුගිය අධික පෑවිල්ල කාලයේ ලවණ උඩට එනකොට ගොවියෝ මට පෞද්ගලිකව කිව්වා, "සර්, ඒ කාලයේ නම් මේ වෙනකොට වතුර සම්පූර්ණයෙන්ම ලුණු වුණා. මේ ලවණ බාධකය නිසා දැන් යම්කිසි සහනයක් තිබෙනවා" කියලා. මේක ක්ෂණික පපඩම්, ක්ෂණික නූඩ්ල්ස් වාගේ කඩිනම් විසඳුම් දෙන්න පුළුවන් කාරණයක් නොවෙයි. මේ ලවණ බාධකය කොරියානු සමාගමක් කොරියානු තාක්ෂණයට අනුවයි ඉදිකළේ. මේ සඳහා දැවැන්ත මුදලක් වියදම් කරලා තිබෙනවා.

විපක්ෂ නායකතුමා ලොකු අසත්‍යයක් කිව්වා, ගොවීන්ට සත පහක්වත් වන්දි දීලා නැහැ කියලා. ඒ වන්දි දීලා නැහැයි කියන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්, වාරිමාර්ග අමාත්‍යාංශයෙන් හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන්. නමුත් මේ ලවණ බාධකය ඉදිකරන කාලයේ අවස්ථා කිහිපයකදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් - National Water Supply and Drainage Board - ගංවතුරෙන් යට වෙන ගොවීන්ට යම්කිසි සහනයක් ලබා දීලා තිබෙනවා. මේ පිළිබඳව සවිස්තරාත්මක තොරතුරක් සති දෙකකින් ලබා දෙන්න මා බලාපොරොත්තු වෙනවා. ඒ නිසා කාරුණිකව ඉල්ලනවා, ගං වතුර වෙලාවේ ගිහිල්ලා ඒ ගං වතුර පෙන්වලා තමුන්ගේ පටු දේශපාලන වාසිය ගන්න යන්න එපා කියලා. එහෙම වුණොත්, අපට මේ කටයුත්ත කර ගන්න බැරිව ගියොත්, පෑවිල්ල කාලයට ජනතාවට බොන්න වතුර ටිකක් නැතිව දුක් විඳින්න වෙයි. ඒ නිසා මේක ඉතාම සංවේදී කාරණයක්. මේක දේශපාලනයට පාවිච්චි කරන්න එපා කියන කාරුණික ඉල්ලීම මේ වෙලාවේ කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මේ ප්‍රශ්නයට අදාළවද කථා කරන්නේ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
පැහැදිලිවම මේකට අදාළවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිල්වලා ගඟෙන් ගන්නා වතුර තමයි ඔබතුමා නියෝජනය කරන හම්බන්තොටටත් එන්නේ. ඒ නිසා ලවණ සහිත ජලය නොඑන විධියට ඒ කටයුත්ත කිරීම ගැන කිසි තර්කයක් නැහැ. මෙතැන හොඳ වැඩක් නිවැරදිව නොකිරීමේ ප්‍රශ්නයක් තිබෙන්නේ; හොඳ වැඩක් වැරදියට කිරීමේ ප්‍රශ්නයක් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරනවා. මේ සභාවේ ශුද්ධ වූ බොරු ගණනාවක් කියැවුණා. ඉතා පැහැදිලිව, මේ ප්‍රශ්නය පැන නැඟුණේ මෑත වකවානුවේ කිසිම සැලසුමකින් තොරව ගේට්ටු ක්‍රමයක් ආරෝපණය කිරීම නිසායි.

ඒ එක්කම, ඔබතුමන්ලා නියෝජනය කරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත්, මාතර දිස්ත්‍රික් ලේකම්වරයාත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් කළ සාකච්ඡාවේදී පොරොන්දු වුණා steel piles ගලවන්න. ඒක කඩිනමින් ගලවනවා කියලා ඒ වෙලාවේ කිව්වා. නමුත්, ඒක ගැලෙව්වේ නැහැ. ඒකයි ගොවීන් කලබල වුණේ.

ගරු කංචන විජේසේකර ඇමතිතුමා කිව්වා, පොම්පාගාර ක්‍රියා කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් අහන්නේ මෙයයි. මට මේක අහන්න ඉඩ දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් සොයලා බලන්න මාගොල්ලාගොඩ, තල්ගහගොඩ, තුඩාව පොම්පාගාර කීයක්-*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු කංචන විජේසේකර ඇමතිතුමා කිව්වා, ඒ ගැන හවස සාකච්ඡාවක් තිබෙනවා කියලා. ඔබතුමා ඒ සාකච්ඡාවේදී ඔය ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. ඒකට දැන් උත්තර දෙන්න ගියොත් කාලය අපතේ යනවා.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන, ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා.